# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1341 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 19/08/2024 පැය 1020

## මාධ්‍ය නිවේදනය

**01. සැකකටයුතු මරණයක් - පුදුකුඩිඉරිප්පු පොලිස් වසම.**

2024.08.18 වන දින උදෑසන කාලයේ පුදුකුඩිඉරිප්පු පොලිස් වසමේ මන්නකන්ඩාල් ප්‍රදේශයේ ගව මඩුවක් අසල පැලක සැකකටයුතු ලෙස පුද්ගලයෙකු මියගොස් සිටින බවට පුදුකුඩිඉරිප්පු පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වූ කයිවේලි, පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර මහෙස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු මෘත දේහය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මාන්චෝල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධිය සම්බන්ධයෙන් පුදුකුඩිඉරිප්පු පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරවැව පොලිස් ස්ථානය.**

2024.08.18 වන දින සවස් කාලයේ මොරවැව පොලිස් වසමේ මහදිවුල්වැව ප්‍රදේශයේදී මොරවැව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන මහදිවුල්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**